**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 436**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දහතුන්වැනි වාර්තාව

(2025.06.20 වැනි දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාව)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර
මහතා විසින්
2026 ජනවාරි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2026 ජනවාරි මස 08 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී*

**<u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>**

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>**

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම.,  ( 2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., *(2025.03.21 දින සිට.)*
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම.,  *(2025.05.20 දින සිට)*
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.,  *(2025.03.21 දින සිට)*
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම.,  *( 2025.03.21 දින සිට)*
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම.,  *(2025.03.21 දින සිට)*
8. ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.,  *( 2025.03.21 දින සිට)*
9. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම.,  *(2025.03.21 දින සිට)*
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.,  *(2025.05.20 දින සිට)*
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.,  *(2025.03.21 දින සිට)*
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., *( 2025.05.08 දින සිට)*
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.,  *(2025.03.21 දින සිට)*
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම.,  *(2025.03.21 දින සිට)*
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම.,  *(2025.05.08 දින සිට)*
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.,  *(2025.03.21 දින සිට)*
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම.,  *(2025.03.21 දින සිට)*
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,

29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*

**<u>කාරක සභාවේ උපදේශකවරුන්</u>**

- ❖ උපදේශක, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - සරත් මායාදුන්නේ මහතා
- ❖ උපදේශක, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - පියසේන රණසිංහ මහතා

**<u>කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ❖ ප්‍රධාන නිලධාරි - එච්. රූපානි ද සොයිසා මිය
- ❖ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. එල්. වික්‍රම මයා
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - එම්.එන්.පී. පෙරේරා මෙය

**<u>කාරක සභා වාර්තා</u>**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

## පටුන


| | පිටු අංක |
|---|---|
| 1. සභාපතිතුමාගේ සටහන | V |
| 2. විධායක සාරාංශය | VII |
| 3. දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දහතුන්වැනි වාර්තාව | VIII |
| 4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 1 |
| 5. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් පරීක්ෂා කරන ලද ආයතනය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | 2-25 |

**<u>සභාපතිතුමාගේ සටහන</u>**

පාර්ලිමේන්තුවේ විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභා යටතේ ස්ථාපිත, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2025.06.20 දින පරීක්ෂාවට ලක් කළ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතට ගැනෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2022, 2023 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ එහි වර්තමාන කාර්ය සාධනයට අදාළව සිදු කළ විමර්ශනයේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාලය පනත මගින් පිහිටුවා ඇති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය, පාලක සභා සංයුතිය, සංයුක්ත සැලැස්ම, කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයද ඇතුළුව සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා පොදු සංවිධාන ව්‍යුහයක් සකස් කිරීම, මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු විශ්වවිද්‍යාලවල පාලක සභාවට පත් කිරීම, විශ්වවිද්‍යාලයේ අරමුණු සමග සමපාත වන පරිදි, සෑම වසර 05 කට වරක් යාවත්කාලීන වන පරිදි සංයුක්ත සැලසුම් සකස් කිරීම මෙන්ම මේ සම්බන්ධයෙන් සියලුම විශ්වවිද්‍යාල සඳහා වැඩමුළුවක් පවත්වා අදාළ සංයුක්ත සැලසුම් පොදු ආකෘතියකට අනුව නිවැරදිව සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මෙන්ම සමස්ත විශ්ව විද්‍යාල පද්ධතියේම පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා මැදිහත් වී සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු විය.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අවධානය යොමු කළ කාරක සභාව, විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු ද ඇතුළත් විවිධ අරමුදල් සඳහා නිශ්චිත ආකෘතියක් ගොඩනැඟීම, එම අරමුදල් පවත්වාගෙන යාමේදී ඒ මගින් බාහිර උපාධි හදාරන ශිෂ්‍යයන් සඳහා සහනයක් ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කිරීම හා විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනය විධිමත් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම ආදිය සඳහා නිර්දේශ ලබා දී ඇති අතර, සිසු ගැටුම් අවම වන පරිදි ශිෂ්‍ය සංගම් නිසි පරිදි ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට ද, විශ්ව විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කොට ඒවා භාවිතයට ගැනීමට කටයුතු කිරීම මෙන්ම, ප්‍රසම්පාදන කටයුතු කිරීමේදී ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ නව චක්‍රලේඛය වන 2024 දෙසැම්බර් 19 දිනැති අංක 1/2024 දරන චක්‍රලේඛය අනුව

විශ්වවිද්‍යාලය සඳහා වෙනම ප්‍රසම්පාදන අංශයක් පිහිටුවා ප්‍රසම්පාදන කටයුතු නිවැරදිව කිරීමට නිර්දේශ ලබා දී ඇත.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විසින් කරනු ලබන පරීක්ෂාවන් මගින් ලැබිය යුතු උපරිම සේවය රටට ලැබෙන්නේ මෙම කමිටුවේ නිර්දේශ අඛණ්ඩව, පසු විපරම් කරමින්, ඒවා ක්‍රියාත්මක කිරීම දක්වා ගෙන ඒම තුළින් වේ. මෙහිදී රටේ පරමාධිපත්‍ය බලය හිමි මහජනතාවගේ සහ ඔවුන්ගේ නියෝජිතයන් ලෙසින් මේ ගරු සභාවේ කාර්යභාරය නිසි ලෙස අඛණ්ඩව පවත්වා ගනිමින් කටයුතු කිරීමත්, වඩා ඵලදායී ලෙස මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කරවීමට උත්සාහ ගැනීමත් කාරක සභාව විසින් කරනු ලැබේ.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, එහි සාමාජික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහායත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් සහ කාරක සභාවේ උපදේශකවරු දෙදෙනාගෙන් ලැබෙන සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්ගෙන් සහ ජාතික විගණන කාර්යාලයෙන් ලබා දුන් සහායත් අගය කොට සලකමි.

වෛද්‍ය නිශාන්ත සමරවීර
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

## <u>විධායක සාරාංශය</u>

2025.06.20 වැනි දින පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2022, 2023 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ එහි වර්තමාන කාර්යසාධනය පිළිබඳව කරුණු පරීක්ෂා කරන ලදී.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාලය පනත මගින් පිහිටුවා ඇති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ අනෙකුත් රාජ්‍ය විශ්ව විද්‍යාල සම්බන්ධයෙන් වන පහත කරුණු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

- සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා පොදු සංවිධාන ව්‍යුහයක් සකස් කිරීම.
- මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු විශ්වවිද්‍යාල පාලක සභාවට පත් කිරීම.
- විශ්වවිද්‍යාලයේ අරමුණු සමග සමපාත වන පරිදි, සෑම වසර 05 කට වරක් යාවත්කාලීන වන චක්‍රීය සංයුක්ත සැලසුම් සකස් කිරීම.
- ජාතික විගණන කාර්යාලයද සම්බන්ධ කොටගෙන සියලුම විශ්වවිද්‍යාල සඳහා වැඩමුළුවක් පවත්වා පොදු ආකෘතියකට අනුව නිවැරදිව සංයුක්ත සැලසුම් සකස් කිරීම.
- විශ්වවිද්‍යාලය විසින් ස්ථාවර තැන්පතු පවත්වාගෙන යාමේදී බාහිර උපාධි හදාරන ශිෂ්‍යයන් සඳහා සහනයක් ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කිරීම.
- විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනය විධිමත් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.
- සිසු ගැටුම් අවම කර ගැනීම හා සිසුන් සම්බන්ධයෙන් සාධාරණව මෙන්ම මානුෂීයව කටයුතු කිරීම.
- ශිෂ්‍ය සංගම් නිසි පරිදි ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටුයුතු කිරීම.
- විශ්ව විද්‍යාලයේ නිම කිරීමට ප්‍රමාද වී ඇති ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 04/2016 චක්‍රලේඛය රජයේ විශ්වවිද්‍යාල විසින් වැරදි ලෙස අර්ථකථනය කිරීම වැළැක්වීම.
- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 19 දිනැති අංක 1/2024 නව චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාලය සඳහා වෙනම ප්‍රසම්පාදන අංශයක් පිහිටුවීම හා නිවැරදිව ප්‍රසම්පාදන කටයුතු කිරීම.

**දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය**
**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දහතුන්වැනි වාර්තාව**

කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේදී 2025.11.26 දින දක්වා පහත ආයතන පරීක්ෂා කරන ලදී.

| අනු අංකය | කැඳවූ ආයතනය | කාරක සභාව පැවැත් වූ දිනය |
|---|---|---|
| 1. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.18 |
| 2. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.20 |
| 3. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.02.27 |
| 4. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.05 |
| 5. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 2025.03.12 |
| 6. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.27 |
| 7. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 2025.04.02 |
| 8. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.05.08 |
| 9. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 2025.05.09 |
| 10. | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 2025.05.15 |
| 11. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.05.23 |
| 12. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 2025.06.04 |
| 13. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2025.06.20 |
| 14. | මහපොළ භාරකාර අරමුදල | 2025.07.09 |
| 15. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.07.17 |
| 16. | රාජ්‍ය දැව සංස්ථාව | 2025.07.23 |
| 17. | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 2025.08.20 |

| | | |
|---|---|---|
| 18. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2025.09.10 |
| 19. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2025.09.12 |
| 20. | ලංකා විදුලිබල මණ්ඩලය | 2025.09.24 |
| 21. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 2025.10.08 |
| 22. | ලංකා සතොස ලිමිටඩ් | 2025.10.10 |
| 23. | ලංකා විදුලිබල මණ්ඩලයේ පරීක්ෂණයට අදාළව එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම හා එහි පරිපාලිත සමාගම් | 2025.10.24 |
| 24. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.19 |
| 25. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.26 |

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 462 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව- 2025.09.04 දිනට)

ඒ අතරින්, 2025.06.20 වැනි දින කාරක සභාව විසින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2022, 2023 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට කාරක සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

## <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2022 සහ 2023 වර්ෂවල විගණකාධිපති වාර්තාවලට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| විගණන මතය | |
|---|---|
| **2022** | **2023** |
| තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |

<u>විගණන මත වර්ග</u>

**01.** <u>තත්ත්වාගණනය නොකළ මතය (Unqualified Opinion)</u>

මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

**02.** <u>තත්ත්වාගණනය කළ මතය (Qualified Opinion)</u>

වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

**03.** <u>මතය ව්‍යාවනය කිරීම (Disclaimer of Opinion)</u>

ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

**04.** <u>අහිතකර මතය (Adverse Opinion)</u>

ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

## ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

***(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය)***

**පරීක්ෂා කරන ලද දිනය -2025.06.20**

### 01. සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

**1.1 සංවිධාන ව්‍යුහය**

සියලුම විශ්වවිද්‍යාල සඳහා පොදු සංවිධාන ව්‍යුහයක් සකස් කිරීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල සංවිධාන ව්‍යුහය සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා පොදු සංවිධාන ව්‍යුහයක් සකස් කරන ලෙසට කාරක සභාව විසින් ලබා දෙන ලද නිර්දේශය පරිදි අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2025.08.12 දිනැති ලිපිය මගින් සමස්ත විශ්ව විද්‍යාල පද්ධතිය සඳහා සකස් කරන ලද පොදු සංවිධාන ව්‍යුහය කාරක සභාව වෙත ඉදිරිපත් කොට ඇත.

**කාරක සභාවේ නිර්දේශය**

ඉහත සඳහන් පොදු සංවිධාන ව්‍යුහය සමස්ථ විශ්ව විද්‍යාල පද්ධතියට අදාළව ක්‍රියාවට නැංවීම.

**1.2 පාලක සභා සංයුතිය**

1985 අංක 07දරන විශ්වවිද්‍යාල සංශෝධිත පනතින් සංශෝධිත 1978 අංක 16දරන විශ්වවිද්‍යාල පනතේ vii කොටසේ 44 වගන්තිය ප්‍රකාරව විශ්ව විද්‍යාල පාලක සභාව සාමාජිකයින් 29 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත්, 2025

ජූනි 12 වැනි දින වන විට සාමාජිකයින් 26 දෙනෙකු පමණක් පත්කර තිබූ බවත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කළ යුතු සාමාජිකයන් 15 දෙනෙකුගෙන් තුන් දෙනෙකු පත් කර නොමැති බව නිරීක්ෂණය කළ කාරක සභාව මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු විශ්වවිද්‍යාලයේ පාලක සභාවට පත් කිරීමට හැකියාවක් තිබේද යන්න පිළිබඳවත් අවධානය යොමු කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ප්‍රතිපාදන ලැබෙන බැවින් ඒ හා සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු විශ්වවිද්‍යාලයේ පාලක සභාවට පත් කිරීම.

ii. මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබන සියලුම විශ්වවිද්‍යාලවල පාලක සභාවලට මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු පත් කිරීමට හැකි වන පරිදි පාලක මණ්ඩල සංයුතිය සංශෝධනය කිරීම.

## 1.3 <u>සංයුක්ත සැලැස්ම</u>

වර්ෂ 2021 සිට 2025 කාලපරිච්ඡේදය සඳහා විශ්වවිද්‍යාලය විසින් සකස් කර තිබූ සංයුක්ත සැලැස්ම 2021 ජනවාරි 18 දින පාලක සභාව විසින් අනුමත කර තිබූ නමුත්, එම සංයුක්ත සැලැස්ම වර්තමානයට ගැළපෙන ආකාරයට සංශෝධනය කර නොතිබූ බැවින් එය නැවත සකස් කර කාරක සභාවට ලබා දෙන ලෙස නිර්දේශ කරන ලදී. නැවත සකස් කළ සංයුක්ත සැලැස්ම කාරක සභාවට ඉදිරිපත් කළ බවට තොරතුරු 2023 ජූනි 12 වන දින දක්වා විගණනයට ඉදිරිපත් වී නොතිබුණි. තවද, පීඨ 11 ක අධ්‍යනාංශ 95 ක උපාධි පාඨමාලා 126 ක් සඳහා දේශන ප්‍රතිමාන සැලැස්ම (lecture norms plan) වර්ෂාවසානය වන විටත් සකස් කර නොතිබූ බව කාරක සභාවට නිරීක්ෂණය විය.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>

i. වර්ෂ 2025 සිට 2029 දක්වා වූ කාලය සඳහා සංයුක්ත සැලැස්ම විශ්වවිද්‍යාලයේ අරමුණු සමග සමපාත වන ලෙස හා සෑම වසරක් සඳහාම චක්‍රීය ආකාරයෙන් (Rolling plan) සකස් කර (2026 - 2030, 2027 - 2031 ආදී ලෙස) කාරක සභාවට ඉදිරිපත් කිරීම.

ii. දැනටමත් සකස් කර ඇති සංයුක්ත සැලැස්මට අනුව සෑම වසරකම විශ්වවිද්‍යාලයේ කටයුතු ක්‍රියාවට නංවන්නේ ද යන්න පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම.

iii. ඉදිරි කාලය සඳහා සංයුක්ත සැලසුම් සකස් කිරීමේදී, ජාතික විගණන කාර්යාලය ද සම්බන්ධ කොටගෙන සියලුම විශ්වවිද්‍යාල සඳහා වැඩමුළුවක් පවත්වා සංයුක්ත සැලසුම් පොදු ආකෘතියකට අනුව නිවැරදිව සකස් කිරීම.

## 1.4 <u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම</u>

2021 නොවැම්බර් 17 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තු චක්‍රලේඛය අනුව අවම වශයෙන් සෑම කාර්තුවකටම වරක් විගණන හා කළමනාකරණ කමිටුව රැස්විය යුතු වුවද, 2024 වර්ෂයේ වාර 03 ක් හා 2025 වර්ෂයේ ජූනි මස දක්වා වාර 02 ක්ද රැස්වීම් පවත්වා ඇති බව කාරක සභාවට නිරීක්ෂණය වූ අතර කමිටු රැස්වීම නියමිත දිනයේ පැවැත්වීමට නොහැකි වූවහොත් ආසන්න දිනක හෝ පැවැත්විය යුතු බව කාරක සභාව අවධාරණය කළාය.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>

i. සෑම කාර්තුවකටම වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

## 1.5 කාර්ය මණ්ඩල සංයුතිය

### 1.5.1 පුරප්පාඩු

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 2,785 ක් හා ඉන් ස්ථිර පදනම මත නිලධාරීන් 1,698 ක් කටයුතු කරන බවත්, අනුමත තනතුරු පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීමෙන් තොරව වර්ෂ ගණනාවක සිට තාවකාලික හා කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් 587 ක් බඳවාගෙන ඇති බවත්, 2025 අප්‍රේල් 30 දිනට මුළු පුරප්පාඩු සංඛ්‍යාව 500 ක් වූ බවත් කාරක සභාවට අනාවරණය විය.

විශ්වවිද්‍යාලයේ, විවිධ සේවක බාණ්ඩ යටතේ ඇති තනතුරු සඳහා පවතින පුරප්පාඩු පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කරන ලද නිර්දේශය අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ 2025.07.25 දිනැති ලිපිය මගින් එකී වාර්තාව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ට හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිටද පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත.

සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති පුරප්පාඩු සහ ඒවා පිරවීමට අදාළව කර ඇති ඉල්ලීම් සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කරන ලද නිර්දේශය අනුව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2025.08.12 දිනැති ලිපිය මගින් එකී වාර්තාව කාරක සභාව වෙත යොමු කර ඇත.

**කාරක සභාවේ නිර්දේශය**

විශ්වවිද්‍යාලයේ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**1.5.2 <u>විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරි LOLC සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ ධූරයක කටයුතු කිරීම</u>**

විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී 2025.01.23 දින එල්.ඕ.එල්.සී (LOLC) සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ ධූරයකට පත්කර ඇති අතර, එකී තනතුර භාරගැනීමට අවසරය ඇය විසින් 2025.01.24 දින ඉල්ලා තිබීමත්, එම ඉල්ලීම ලේඛකාධිකාරී විසින් නිර්දේශ කිරීමෙන් අනතුරුව, උපකුලපතිවරයා විසින් එය අනුමත කිරීමත්, අනතුරුව 2025.03.14 දින පැවති 563 වැනි පාලක සභාවේදී එයට පාලක සභා අනුමැතිය ලබා දීම පිළිබඳවත් කාරක සභාවේ අවධානය යොමු විය.

ඊට අමතරව, පහත කරුණු කාරක සභාවට අනාවරණය විය.

- 2024.08.01 දින සිට මෙම නිලධාරිනිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලයේ උපදේශකවරයකු ලෙස සේවා පැවරුම් පදනම මත පත්වීම සම්බන්ධයෙන් පාලක සභා අනුමැතිය ලැබීම.
- 2024 වර්ෂය හා 2025 වර්ෂය (2025.06.12 දින දක්වා) සඳහා මෙම නිලධාරිනියගේ පැමිණීම, පිටවීම සඳහන් නොවූ දින මෙන්ම නිවාඩු දින පිළිවෙලින් 26ක් හා 24ක් බැගින් තිබීම.
- තවද, 2024 වර්ෂයේ දින 44ක පැමිණීම හා පිටවීම සඳහන් නොවීම සම්බන්ධයෙන් 2025.02.19 දිනැති ලිපියක් මගින් තම පැමිණීම හා පිටවීම සටහන් වී නොතිබීම නිවැරදි කර දෙන ලෙස අදාළ නිලධාරිනිය කළ ඉල්ලීමට ලේඛකාධිකාරී විසින් අනුමැතිය ලබා දීම මගින් විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීනව රාජකාරි කිරීමට බාධාවක් සිදු වී ඇති බව පෙනී යන බවත් කාරක සභාවට අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරීවරිය;

- LOLC සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ ධූරයක් සඳහා නිදහස් කිරීම,
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලයේ උපදේශකවරයෙකු ලෙස සේවය කිරීමට මුදා හැරීම හා
- දින 44ක පැමිණීම හා පිටවීම සටහන් නොකිරීම එකවර නිවැරදි කිරීමට අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යයනය කර අදාළ අනුමැතීන් ලබා දීම ඇතුළත්ව සමස්ථ ක්‍රියාවලිය පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

ii. විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්යය මණ්ඩල සේවකයින් වෙනත් තනතුරු සඳහා නිදහස් කිරීම් කර ඇත්ද යන්න සම්බන්ධයෙන් සොයා බලා, එසේ නිදහස් කිරීම් සිදු කර තිබෙන්නේ නම් සියලුම විශ්වවිද්‍යාල පොදු ආකෘතියට අනුගත කර නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

### 1.5.3 <u>විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති කළමනාකරු (Project Manager) තනතුර සඳහා බඳවාගැනීමේ ක්‍රමය පිළිබඳ ගැටලුව</u>

විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති කළමනාකරු (Project Manager) තනතුර සඳහා බඳවාගැනීමේ පටිපාටිය අනුව පිළිගත් විශ්වවිද්‍යාලයක සිවිල් ඉංජිනේරු විශේෂ උපාධියක් සමග පිළිගත් ඉංජිනේරු ආයතනයක සාමාජිකත්වය සහ කොන්ත්‍රාත් ව්‍යාපෘති සම්බන්ධයෙන් වසර 10ක පළපුරුද්ද අවශ්‍ය වන අතර, මෙම තනතුර සඳහා ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීමකින් හෝ ඉල්ලුම්පත් කැඳවීමකින් තොරව නිලධාරිනියක් බඳවාගැනීමට කටයුතු කර තිබුණි. මෙම ව්‍යාපෘති කළමනාකාරවරිය බඳවාගැනීමේදී, අමාත්‍යාංශය හෝ අදාළ පාර්ශව දැනුවත් කර නොමැති බවත්, සුවිශේෂී තත්ත්වයන්වලදී වුවද බඳවාගැනීම

සඳහා අදාළ ක්‍රියාපටිපාටීන් අනුගමනය කර නිසි අනුමැතිය ලබා ගෙන කටයුතු කළ යුතු බවත් නිරීක්ෂණය කළ කාරක සභාව, එකී හේතුව නිසා මෙම තනතුර සඳහා වැටුප් ගෙවීම සුදුසු ද යන්න පිළිබඳව සලකා බැලිය යුතු බවත්, කාරක සභාවේ අදහස විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. දැනට කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගෙන ඇති නිලධාරිනියගේ, සුදුසුකම්වලට සරිලන ලෙස හා බඳවාගැනීමේ පටිපාටියට අනුකූල වන සේ අදාළ පත්වීම නිවැරදි ක්‍රමවේදය යටතේ ලබා දීමට කටයුතු කිරීම.

ii. මෙම තනතුර ද ඇතුළත්ව එසේ බඳවාගෙන ඇති සියළුම තනතුරු සඳහා, බඳවාගැනීම් සම්බන්ධයෙන් පහත කරුණු ඇතුළත් කර වාර්තාවක් සකස් කර කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.
   - අදාළ තනතුරු සඳහා බඳවාගැනීම් කළ ආකාරය
   - ඒ අනුව අදාළ බඳවාගැනීම් සම්බන්ධයෙන් වන නීත්‍යානුකූලභාවය
   - අදාළ නිවැරදි කිරීම් සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

iii. විශ්වවිද්‍යාලයට අදාළ සමස්ථ කාර්ය මණ්ඩල සංයුතිය, පුරප්පාඩු සංඛ්‍යාව, පුරප්පාඩු පිරවීමේදී නිසි ක්‍රමවේදය අනුගමනය නොකළ අවස්ථා සම්බන්ධයෙන් සලකා බලා ඒවා නිවැරදි කිරිම සඳහා ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම.

iv. සියලුම විශ්වවිද්‍යාලවලට අදාළ පුරප්පාඩු, කාර්ය මණ්ඩල සංයුතිය, බඳවාගැනීම් හා නිලධාරීන් නීත්‍යාකූල නොවන ආකාරයෙන් කටයුතු කිරීම් සම්බන්ධයෙන් ඇති ගැටලු පිළිබඳ අවධානය යොමු කර ඒ සඳහා සුදුසු පියවර ගැනීම.

## 1.6 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

මේ පිළිබඳව පහත කරුණු කාරක සභාවට හෙළි විය.

- විශ්වවිද්‍යාලයට අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් මෙන්ම, ස්වයං මූල්‍ය පාඨමාලා සහ විදේශ/වෙනත් ආයතන හරහා ප්‍රදානයන් ලෙස ලැබෙන බව,
- 2024 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි ඒකකය ස්වයං මූල්‍ය පාඨමාලා හරහා රු. මිලියන 157 ක අතිරික්තයක් උපයා ඇති බව,
- ගිණුම්කරණ ක්‍රමවේදයට අනුව, 2024 වර්ෂය සඳහා රු. මිලියන 878 ක ආදායමක් හඳුනාගත යුතු වුවද, හඳුනාගෙන ඇත්තේ රු. මිලියන 491 ක් පමණක් බව,
- රු. මිලියන 878 ක මුදලට දේශන ගාස්තු විශාල ප්‍රමාණයක් ඇතුළත් වන බව,
- මෙම දේශනවලට අදාළ ගාස්තු අයකරන නිසි ක්‍රමවේදයක් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නොමැති වීම,
- සමස්ත ආදායමෙන් ප්‍රතිශතයක් වැටුපට අමතරව දේශකයන් අතර බෙදී යන බැවින්, මෙම පිරිවැය අවසානයේ ශිෂ්‍යයන්ට දරන්නට සිදුවීම,
- මෙම පාඨමාලා වඩා අඩු ගාස්තුවලට ශිෂ්‍යයන්ට ලබා දීමේ අවස්ථාව ඇති බව,
- උපයා ඇති ආදායමෙන් මේ වන විට රු. මිලියන 6,875 ක ස්ථාවර තැන්පතු පවත්වාගෙන යන අතර, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2023.03.24 දින මේ පිළිබඳ නිර්දේශ ලබා දී තිබුණද, ඒවා ක්‍රියාත්මක වී නොමැති වීම,
- විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් ව්‍යාකූල තත්ත්වයක් පැවතීම,
- 2024 වර්ෂයේ අතිරික්තය වන රු. මිලියන 3,661 ක මුදල විශ්වවිද්‍යාලයේ අරමුදලට මෙන්ම විශ්වවිද්‍යාලයේ ඇති වෙනත් අරමුදල්වලට යොමු වන බව.

**<u>කාරක සභාවේ නිර්දේශ</u>**

i. විශ්වවිද්‍යාලය තුළ විවිධ අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු ඇතුළත් විවිධ අරමුදල් සඳහා නිශ්චිත ආකෘතියක් ගොඩනැඟීම හා විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනය විධිමත් කිරීමට අදාළ පැහැදිලි කිරීම් ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**1.7 <u>බාහිර උපාධි ඒකකයේ ගැටලු</u>**

**<u>බාහිර උපාධි ඒකකයේ උපාධි ප්‍රදානෝත්සවය සඳහා ශිෂ්‍යයන්ගෙන් වැඩි මුදලක් එකතු කිරීම</u>**

බාහිර උපාධි ඒකකයේ උපාධි ප්‍රදානෝත්සවය සඳහා 2023 වර්ෂයේදී එක් ශිෂ්‍යයෙකුගෙන් රු. 9,000/- ක් අය කරගෙන තිබූ අතර, 2023 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවයෙන් පසුව රු, 4,576,860/- ක් ඉතිරි වී තිබීමත් 2024 වර්ෂයේදී එක් ශිෂ්‍යයෙකුගෙන් රු. 10,500/- ක මුදලක් අය කර ගෙන තිබීම හා උපාධි ප්‍රදානෝත්සවයෙන් පසුව රු. 5,368,952/- මුදලක් ඉතිරි වී තිබීම මෙන්ම එම අයකිරීම් සිදු කළේ කුමන නිර්ණායක මත පදනම්ව ද යන්න හා උපාධි ප්‍රදානෝත්සවය විශ්වවිද්‍යාලය තුළ පැවැත්වීමට ඇති හැකියාව පිළිබඳවත් කාරක සභාව අවධානය යොමු කළාය.

**<u>කාරක සභාවේ නිර්දේශ</u>**

i. උපාධි ප්‍රදානෝත්සවය ඇතුලු විශ්වවිද්‍යාලයේ වෙනත් කටයුතුවලදී අවම පිරිවැයක් යටතේ මූල්‍ය පුරෝකථනය නිවැරදිව කිරීම මඟින් ශිෂ්‍යයින්ට මූල්‍ය සාධාරණයක් ඉටු කිරීමට පියවර ගැනීම.

**<u>බාහිර උපාධි ඒකකයේ ලාභයෙන් 65%ක මුදලක් නිලධාරීන් අතර බෙදා දීම</u>**

2024.03.14 දින පැවති මුදල් කමිටුවේ තීරණයකට අනුව උපකුලපති, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, පීඨාධිපති ඇතුලු නිලධාරීන් ගණනාවකට

රු.3000/- සිට 23,000/-ක් දක්වා මාසික දීමනාවක් බාහිර උපාධි ඒකකයේ ආදායමින් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබීම හා බාහිර විභාග අංශයේ සියලුම නිලධාරීන්ට රු. 9,000/- ක සිට රු. 25,000/- ක් දක්වා පරාසයක අතිරේක මාසික දීමනාවක් ගෙවා තිබීමත්, මෙම පාඨමාලා පවත්වාගෙන යාම බාහිර උපාධි ඒකකයේ නිලධාරීන් වෙත පැවරී ඇති රාජකාරියක් වන බැවින්, අතිරේක දීමනාවක් ලෙස මෙම දීමනාව ගෙවීම සඳහා විධිමත් අනුමැතියක් ලබා නොගැනීම පිළිබඳව මෙන්ම, බාහිර පාඨමාලා පවත්වන පීඨ 02 විසින් අධ්‍යයන කමිටුව මසකට වරක් රැස් වී, එක් සාමාජිකයෙකුට එක් කමිටු වාරයක් සඳහා රු.2,500/- ක මුදලක් ගෙවා තිබීම සම්බන්ධයෙන්ද කාරක සභාව අවධානය යොමු කළාය.

මෙහිදී, විශ්වවිද්‍යාල රාශියක් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 04/2016, සම්බන්ධයෙන් වැරදි අර්ථකතනයක් ලබා දෙන බව කාරක සභාවට හෙළි විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. මෙම කරුණට අදාළ ගෙවීම් සඳහා අදාළ වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 04/2016 චක්‍රලේඛය වැරදි ලෙස අර්ථකථනය කර කටයුතු කිරීම පිළිබඳව අවධානය යොමු කර, එලෙස වැරදි ලෙස අර්ථකථනය කිරීම වැළක්වීම සඳහා සුදුසු පියවර ගෙන කාරක සභාවට වාර්තා කිරීම.

### 1.8 <u>විශ්වවිද්‍යාලයට අභ්‍යන්තර සිසුන් බඳවාගැනීම</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පසුගිය අධ්‍යයන වර්ෂ 04 සඳහා සිසුන් 17,117 ක් පීඨ 10ක් වෙනුවෙන් ලියාපදිංචි කිරීම සඳහා අනුමත කර තිබුණද, සිසුන් 18,047 ක් එම පාඨමාලා සඳහා ලියාපදිංචි වී තිබුණි. 2022/2023 වර්ෂ සඳහා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 1,130 ක් වූ බවත්,

විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 1,286 ක් බවත්, 2019/2020, 2020/2021 හා 2021/2022 යන සෑම වසරකම මානව ශාස්ත්‍ර පීඨයේ අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි වී ඇති බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

z-score සීමාව තුළ නොමැති සිසුන් විශ්වවිද්‍යාලයට බඳවාගෙන සිටින්නේද යන්න පිළිබඳව සමාජයේ අවධානය යොමු වී ඇති බැවින්, විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවාගැනීම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණය ආශ්‍රයෙන් කාර්යක්ෂම ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය කාරක සභාව අවධාරණය කරන ලදී.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීම පිළිබඳව අධ්‍යනය කර (පසුගිය අධ්‍යයන වර්ෂ 04 සඳහා) එසේ ලියාපදිංචි කර ඇති සිසුන්ගේ ලියාපදිංචිය අදාළ විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීමට තීරණය කළ විවිධ දිස්ත්‍රික්කවලට අදාළ Z-Score සීමාවන් තුළ සිටින ශිෂ්‍යයින්ට හිමි වී තිබේද යන්න පිළිබඳව වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම. (විවිධ දිස්ත්‍රික්කවලට අදාළ Z-Score සීමාවන් තුළ සිටින ශිෂ්‍යයන්ට පමණක් විශ්වවිද්‍යාල වරම් හිමිවන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා)

## 1.9 <u>සිසු ගැටුම්</u>

සිසු ගැටුමක් හේතුවෙන් මහාචාර්ය හෙට්ටිආරච්චි ශිෂ්‍ය නේවාසිකාගාරයට හානි සිදු වීම සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව, එම ගැටුමට ඍජුව සම්බන්ධයැයි හඳුනාගත්, ගැටුමට අදාළ එක් පාර්ශවයකට අයත් සිසුන් 10 දෙනෙකුගෙන් විශ්වවිද්‍යාලයේ දේපළ හානි වීමකට අදාළව, හානිය

ප්‍රතිස්ථාපනය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 946 ප්‍රකාරව හානිය මෙන් 03 ගුණයක් හා 25%ක අධිභාරයක්ද ඇතුළත්ව රු.1,440,000/- ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර තිබීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

මෙම සිද්ධියෙන් මාස 04කට පසු, එයට අදාළ තවත් ශිෂ්‍යයන් 03 දෙනෙකුගේ ශිෂ්‍යභාවය වසරකට අහෝසි කිරීම, තරයේ අවවාද කර ලිපි යොමු කිරීම හා එකම පාර්ශවයේ සිසුන් 10 දෙනෙකුට දඩ නියම කර ඇති බවත්, තාක්ෂණ පීඨයේ නේවාසිකාගාර ගාස්තු නොගෙවීම සම්බන්ධව 2024.08.26 දින පළ කරන ලද දැන්වීමෙහි, මෙම ගැටුමට සම්බන්ධ යැයි දඬුවම් ලැබ ශිෂ්‍යභාවය වසරකට අහෝසි කළ ශිෂ්‍යයන් 04 දෙනෙකුගේ නම් ද පළ කර තිබූ බවත්, මෙම ගැටුම ශාස්ත්‍ර පීඨයේ හා තාක්ෂණ පීඨයේ සිසු කණ්ඩායම් 02ක් අතර සිදු වූවද, එක් පාර්ශවයකට පමණක් දඬුවම ලබා දී ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

මෙවැනි සිදුවීම්වලට අදාළ පරීක්ෂණ නිවැරදිව හා අපක්ෂපාතීව සිදු කිරීම ඉන්පසුව ගනු ලබන පියවර සඳහා ද වැදගත් වන බව කාරක සභාව අවධාරණය කළාය.

මෙම ගැටුමට සම්බන්ධ යැයි හඳුනාගත් තාක්ෂණ පීඨයේ ශිෂ්‍යයින්ගේ ශිෂ්‍යභාවය අහෝසි කළ කාලය සඳහා නේවාසිකාගර ගාස්තු නොගෙවීම සම්බන්ධයෙන් දැන්වීම් යැවීමට අදාළව සොයා බලා වාර්තා කරන ලෙසට කරන ලද නිර්දේශය පරිදි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ 2025.07.25 දිනැති ලිපිය මගින් ඊට අදාළ වාර්තාව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ට හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිටද පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. සිසු ගැටුමට අදාළව සිදුව ඇති දේපළ හානි සඳහා අයකර ගැනීම මෙන්ම 25%ක අධිභාරය යන දඬුවම් දෙකම එකවර ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් කර එය නිවැරදි කිරීමට කටයුතු කිරීම.

ii. මෙම සිසු ගැටුම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

iii. එසේම තාක්ෂණ පීඨයේ නේවාසිකාගාරයේ ලියාපදිංචි වී නොසිටින ශිෂ්‍යයන්ට ද නේවාසිකාගාර ගාස්තු නොගෙවීම සම්බන්ධයෙන් ලිපි නිකුත් කර තිබීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර කාරක සභාවට වාර්තා කිරීම.

**1.10 <u>විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගම් ලියාපදිංචි කිරීම</u>**

මේ සම්බන්ධයෙන් විමසූ කාරක සභාව ශිෂ්‍ය සංගම් නීත්‍යානුකූලව පිහිටුවීම වැදගත් බව අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. ශිෂ්‍ය සංගම් නීත්‍යානුකූල ආකාරයට කඩිනමින් පිහිටුවීමට අදාළ කටයුතු සිදු කිරීම.

**02. <u>2023 මාර්තු 24 සහ 2023 අගෝස්තු 22 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම්වලදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය</u>**

**2.1 <u>නිර්දේශ අංක 06</u>**

**<u>විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ සැලැස්ම සකස් කිරීම</u>**

විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ සැලැස්ම සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට 2023.03.24 සහ 2023.08.22 දිනවල පැවති කාරක සභා රැස්වීම්වලදී ලබා දී තිබූ නිර්දේශ පිළිබඳව

හා මානව සම්පත් කළමනාකරණ සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීමට විශ්වවිද්‍යාලය විසින් දින දීර්ඝ කිරීම් ඉල්ලීම් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවන ලද ලිපි පමණක් විගණනයට ඉදිරිපත් කිරීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වූ අතර, අවුරුදු 25ක් සඳහා මානව සම්පත් කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගික නොවන බැවින් වසර 10ක් සඳහා මෙම සැලැස්ම සකස් කිරීමට තීන්දු කර ඇති බව කාරක සභාවට අනාවරණය විය.

**<u>කාරක සභාවේ නිර්දේශ</u>**

**i.** විශ්වවිද්‍යාල සඳහා මානව සම්පත් කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේදී එය සංයුක්ත සැලැස්ම සමග සමපාත වන ලෙස සකස් කිරීම.

## 2.2 <u>නිර්දේශ අංක 08</u>

### 2.2.1 "<u>මෙත්සෙවණ" ඉඩම විශ්වවිද්‍යාලයට පවරා ගැනීම</u>

අක්කර 07 ක "මෙත්සෙවණ" ඉඩම විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට අදාළව "මෙත්සෙවණ" යළි ස්ථාපනය කිරීමට යෝජිත මුල්ලේරියාව "සන්ෆ්ලවර් ගාර්ඩන්ස්" භූමිය සංවර්ධනය කිරීම සඳහා අවස්ථා දෙකකදී විශ්වවිද්‍යාලය රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා ඇති නමුදු මෙතෙක් අත්පත් කර ගත හැකිව ඇත්තේ "මෙත්සෙවණ" භූමියෙන් අක්කර 04 ක් පමණක් බවත්, තවදුරටත් එම භූමියෙන් අක්කර 03 ක් පවරා ගැනීමට ඉතිරිව තිබීම සම්බන්ධයෙන් මීට පෙර කාරක සභාවේදී සාකච්ඡා කරන ලද බවත්, මේ සම්බන්ධයෙන් 2023.03.28 දින කාරක සභාව විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් යොමු කර තිබුණ ද, ඉඩමේ භුක්තිය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලැබී නොතිබුණු බව කාරක සභාවට නිරීක්ෂණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. "මෙත්සෙවණ ඉඩම" විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට අදාළ කටයුතු කඩිනමින් සිදු කර අවසන් කිරීම.

## 2.2.2 ගංගොඩවිල සෝරත මාවතේ පිහිටි හේමවිමන නැමැති ඉඩම

ගංගොඩවිල සෝරත මාවතේ පිහිටි හේමවිමන නැමැති පර්චස් 186 ක වපසරියකින් යුත් ඉඩම මිලදී ගැනීම සඳහා මහරගම ප්‍රාදේශීය ලේකම්වරයා වෙත රු.මිලියන 107.55 ක මුදලක් ගෙවා ඇති නමුත්, එම ඉඩමෙහි අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබීම පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාව, අදාළ ඉඩම ලබා දුන් පුද්ගලයා විසින් විශ්වවිද්‍යාලය වෙත ඔහු සතු වෙනත් ඉඩම් ද ලබා දී ඇති බැවින්, එම ඉඩම් හා සංසන්දනය කිරීමේදී මෙම ඉඩම සඳහා අඩු තක්සේරුවක් ලබා දී ඇති බවට කරුණු දක්වන බැවින්, නිවැරදිව මෙම ඉඩම පවරා ගැනීම් කටයුතු සිදු කර අවසන් කළ යුතු බව අවධාරණය කළාය.

**<u>කාරක සභාවේ නිර්දේශ</u>**

i. ගංගොඩවිල සෝරත මාවතේ පිහිටි හේමවිමන නැමැති ඉඩම සම්බන්ධ ගැටලුව කල් නොයවා අවසන් කරගැනීමට කටයුතු කර කාරක සභාවට වාර්තා කිරීම.

ii. ඉඩම සම්බන්ධයෙන් නැවත තක්සේරු කිරීමක් කළ හැකිද යන්න පිළිබඳව රජයේ තක්සේරුකරු සමග සාකච්ඡා කර කාරක සභාවට වාර්තා කිරීම.

## 2.3 <u>නිර්දේශ අංක 09</u>

**<u>විශ්වවිද්‍යාලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2022.12.31 දිනට ස්වයං මූල්‍ය පාඨමාලා ආදායමෙන් රු. මිලියන 3,101 ක ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබීම</u>**

විශ්වවිද්‍යාලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2022.12.31 දිනට ස්වයං මූල්‍ය පාඨමාලා ආදායමෙන් රු. මිලියන 3,101 ක ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබීමට අදාළව විධිමත් අනුමැතිය ලබා ගන්නා ලෙස 2023.03.24 දින පැවති කාරක සභාවේදී නිර්දේශ කළද, පසුගිය වර්ෂ 3 හිදී සිදුකිරීමට අපේක්ෂා කළ ආයෝජනයන් සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් අවසර ඉල්ලා ලිපි යොමු කර ඇති නමුත්, අනුමැතිය සහිත ලිපියක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු බව කාරක සභාවට අනාවරණය විය.

උපයන ලද ආදායම්වලට අදාළව විශ්වවිද්‍යාල පනතේ 101 වගන්තිය යටතේ විශ්වවිද්‍යාල පද්ධතියෙහි ඇති මුදල්වල ඇති වටිනාකම රු. බිලියන 17ක් වන බවත්, කාරක සභාවට අනාවරණය විය.

ස්ථාවර තැන්පතුවල ඇති රු. මිලියන 3,101 ක මුදලෙහි ස්වයං මූල්‍ය පාඨමාලාවලට අදාළ මුදල්ද ඇතුළත් වන නිසා ස්ථාවර තැන්පතුවල තැන්පත් කළ පසු විශ්වවිද්‍යාලයේ අවශ්‍යතා සඳහා මුදල් ලබා ගන්නේ කෙසේද යන්න හා විශ්වවිද්‍යාලයේ “අරමුදල්” යන නමින් පවතින අරමුදල් 126 පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. විශ්වවිද්‍යාලයේ අරමුදල් පවත්වාගෙන යාමේදී, ඒ මගින් බාහිර උපාධි හදාරන ශිෂ්‍යයන් සඳහා සහනයක් ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කිරීම.

### 2.4. නිර්දේශ අංක 11

**නව කලා රඟහල සහ විද්‍යාගාර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම**

2011 වර්ෂයේ දී නව කලා රඟහල සහ විද්‍යාගාර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කොන්ත්‍රාත්කරුවකු වෙත ලබා දුන් රු. 2,268,484/- ක අත්තිකාරම් මුදලින් රු.1,764,013/- ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබීමට අදාළව 2023.03.24 දින පැවති කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ සම්බන්ධයෙන් කාරක සභාව අවධානය යොමු කළ අතර, එයට අදාළ විත්තිකරුවන් වන කොන්ත්‍රාත් ලබා ගත් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, පදිංචි ස්ථානවල නොමැති බැවින් නඩුව බහා තබා ඇති බවත්, විත්තිකරුවන් පිළිබඳව සොයා බලා සිවිල් නඩුව ඉදිරියට ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකර නොමැති බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

**කාරක සභාවේ නිර්දේශ**

i. විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් එකඟ වූ පරිදි මෙම කරුණට අදාළ තොරතුරු එවකට ව්‍යාපෘති කළමනාකරු හා එම ව්‍යාපෘතිවලට සම්බන්ධ අනෙකුත් නිලධාරීන්ගෙන් විමසීම් කර කාරක සභාවට වාර්තා කිරීම.

### 2.5. නිර්දේශ අංක 13

**නගර සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘතිය**

නගර සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘතියේ (Improvements of storm water drainage Project) සැලසුම් සකස් කිරීම සඳහා රු. මිලියන 3.663 ක් සහ "Construction of a state of the art Golden Jubilee Commemoration Auditorium with a 2000 seating capacity (70360 sq ft)" ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.මිලියන 5.138 ක් 2016.06.22 දින ගෙවා තිබුණ ද මේ දක්වා එම කාර්යයන් නිම කර නොතිබීමට අදාළව

2023.03.24 දින පැවති කාරක සභා රැස්වීමේදී ලබා දී ඇති නිර්දේශ සම්බන්ධයෙන් අවධානය යොමු විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

මෙම ඉදිකිරීම් කඩිනමින් අවසන් කිරීමට කටයුතු කිරීම.

## 2.6 <u>නිර්දේශ අංක 20</u>

<u>ත්‍යාග හා ශිෂ්‍යත්ව ලබා දීම</u>

2021.12.31 දිනට ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් 104 ක් යටතේ එකතුව රු.39,314,867/- ක ශේෂයක් පැවැතීම හා ඉන් අරමුදල් 82 ක එකතුව රු.31,609,427/- ක ශේෂයක් වර්ෂ 3 කට වැඩි කාලයක සිට උපයෝජනය කර නොතිබීම සහ ත්‍යාග හා ශිෂ්‍යත්ව ලබා දීම සඳහා විවිධ බාහිර පාර්ශවයන් ලබා දෙන මුදල්, අරමුදල් 127 ක් යටතේ වර්ගීකරණය කර ඇති අතර, 2024 වර්ෂාවසානය වන විට එම අරමුදල්වල එකතුව රු.52,063,025 ක ශේෂයක් පැවතුණු අතර, ඉන් අරමුදල් 23 ක එකතුව රු.25,422,333 ක ශේෂය සඳහා වර්ෂ 3 කට වැඩි කාලයක් ගත වී ඇතත් අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වූ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා ඒ අනුව කටයුතු කර නොතිබුණු බව කාරක සභාවට නිරීක්ෂණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

<u>සභාපති/ ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව;</u>

i. පරිත්‍යාගශිලීන්ගෙන් (Donors) ලැබෙන ත්‍යාග හා ශිෂ්‍යත්ව නිවැරදි ලෙස උපයෝජනය වන්නේද යන්න සොයා බලා ඒ සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම.

**2.7** **<u>නිර්දේශ අංක 21</u>**

<u>අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වන විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩල නැවත සේවයට වාර්තා නොකිරීම</u>

අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වන අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩල නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් බැඳුම්කර කඩවීම මත 2022.12.31 දිනට නිලධාරීන් 41 දෙනෙකුගෙන් අයවිය යුතු රු.77,235,211/- ක මුදල නිසි පරිදි අය කර ගෙන නොමැත. එමෙන්ම රු.5,188,694 ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමට නිලධාරීන් 05 දෙනෙක් කැමැත්ත ප්‍රකාශ කර තිබුණද, 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීමට අදාළව කාරක සභා නිර්දේශය ලබා දී වසර 2 කට වැඩි කාලයක් ගත වී ඇතත් මෙම නිලධාරීන් 5 දෙනාගෙන් එක් අයෙකුගෙන් හැර අනෙක් 4 දෙනාගෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය අසමත් වී තිබීම හා ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන නිලධාරීන් 42 කුගෙන් එකතු වටිනාකම රු. 203,358,733/- ක් විශ්වවිද්‍යාලයට අය විය යුතුව පවතින බවට වන කරුණු කෙරෙහි කාරක සභාවේ අවධානය යොමු විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. ඉහත කී රු. 203,358,733/- ක මුදල අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කිරීම.

ii. බැඳුම්කර කඩවීමට අදාළව එකතු වී ඇති අරමුදලේ පොළිය මගින් විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන්ට සප්ත වාර්ෂික නිවාඩු ලබා ගැනීමට අදාළව අවශ්‍ය වන මුදල පුරෝකථනය කර ඉතිරි ප්‍රමාණය මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.

iii. විශ්වවිද්‍යාලය විසින් මහජන මුදල් භාවිතයේදී මූල්‍ය විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම.

## 2.8 නිර්දේශ අංක 22

**කැලේ කඩේ ආපනශාලාව ඉදිකිරීම**

2019 වර්ෂයේ දී කොන්ත්‍රාත් වටිනාකම රු.29,561,377/- ක් වූ විශ්වවිද්‍යාලයේ "කැලේ කඩේ" අපනශාලාවේ අදියර දෙකක් කොටස් වශයෙන් එක් කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී ඇති බවත්, ඔහු විසින් අදාළ ඉදිකිරීම සිදු නොකිරීම මත 2022.05.06 වැනි දින දෙපාර්ශවයේ එකඟතාවයෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට උපකුලපති උපදෙස් ලබා දී තිබුණු බවත්, කාර්යසාධන සුරක්ෂණය වලංගු කාලය තුළ අලුත් නොකිරීම හේතුවෙන් රු.1,478,069/- ක් අය කර ගැනීමට නොහැකි වී ඇති බවත්, අදියර I සහ II හි ගිවිසුම්වල සඳහන් ප්‍රමාණපත් වටිනාකම් ඉක්මවා රු.6,515,825/- ක මුදලක් ගෙවා තිබුණු බවත්, කාරක සභාවට නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳව පෙර පැවති කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළාය.

තවද, කැලේ කඩේ ආපනශාලාවේ අදියර IV යටතේ රු.3,739,571 ක් වැය කර සවිකර තිබූ විදුලි රැහැන් හා උපාංග 2024 වර්ෂය තුළදී සොරකම් කර තිබූ බවත්, එහි දේපල හානි අලාභය රු.3,332,000 ක් ලෙස විශ්වවිද්‍යාල වැඩ ඉංජිනේරු විසින් ඇස්තමේන්තු කර විධිමත් පරීක්ෂණයක් සිදුකර පෞද්ගලික ආරක්ෂක සමාගම වෙත ගෙවිය යුතු බිල්පත්වලින් අඩුකර ගැනීමට තීරණය කර තිබූ බවත්, 2025.06.09 වැනි දින දක්වා කාර්යසාධන බැඳුම්කර අගය වූ රු.722,846 ක මුදල අයකර ගැනීම හැර සම්පූර්ණ අලාභය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බවත් කාරක සභාවට අනාවරණය විය.

"කැලේ කඩේ" ආපනශාලව ඉදිකරන ස්ථානයෙන් විදුලි රැහැන් සොරකම් කිරීම නිසා විශ්වවිද්‍යාලයට සිදු වූ සම්පූර්ණ පාඩුව, විශ්වවිද්‍යාලයට ආරක්ෂාව සපයන පෞද්ගලික ආරක්ෂක සමාගමෙන් අය කර අවසන් කරන ලෙසට කරන ලද නිර්දේශය අනුව අදාළ සම්පූර්ණ පාඩුව එම පෞද්ගලික ආරක්ෂක

සමාගමෙන් අය කර අවසන් බව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2025.08.21 දිනැති ලිපිය මගින් දන්වා ඇත.

**<u>කාරක සභාවේ නිර්දේශ</u>**

i. මෙම ප්‍රසම්පාදන කටයුතුවලට සම්බන්ධ, විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන අංශයේ කටයුතු නිසි ආකාරයෙන් සිදු වන්නේදැයි සොයා බලා කාරක සභාවට වාර්තා කිරීම.

ii. මෙම ආපනශාලාවේ ඉදිකිරීම් නිසි පරිදි සිදු වී ඇත් දැයි සොයා බලා කාරක සභාවට වාර්තා කිරීම.

## 03. <u>2022 හා 2023 වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනයට අදාළව සාකච්ඡා කළ යුතු කරුණු</u>

### 3.1 <u>ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල ඉදි කිරීම</u>

විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD) යටතේ ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල නිර්මාණය හා ඉදිකිරීම් (Designing & Building) ක්‍රමය යටතේ රු.3,624,962,018 ක මුදලකට පුද්ගලික සමාගමක් වෙත 2021 වර්ෂයේදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. 2023 ජූලි මාසය වන විට වැඩ නිම කිරීමට සැලසුම් කර තිබූ නමුත් අවස්ථා 3 කදී කාලය දීර්ඝ කිරීම් ලබාදී 2024 ඔක්තෝබර් මාසය වන විට වැඩ නිම කළ යුතු බවට එකඟතාවයක් ඇති කරගෙන තිබුණි. කෙසේ නමුත් 2025 ජූනි 09 දින වන විටත් ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින්, ඉංජිනේරු පීඨය පවත්වාගෙන යාම සඳහා මාසික කුලී පදනම මත රාවතාවත්ත හා රත්මලාන පිහිටි ගොඩනැගිලි කුලියට ගැනීමට සිදුවීම හේතුවෙන් 2023 ජූලි මාසයේ සිට 2025 මාර්තු මාසය දක්වා වූ කාලය සඳහා වළක්වාගත හැකිව තිබූ රු.49,707,850 ක පිරිවැයක් බදු කුලී ලෙස බාහිර පාර්ශවයක් වෙත ගෙවීමට සිදුව තිබූ බව කාරක සභාවට නිරීක්ෂණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. ඉංජිනේරු පීඨයේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කිරිම.

## 3.2 වෛද්‍ය විද්‍යා පීඨ ව්‍යාධිවේද දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල ඉදිකිරීම

ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන AHEAD ව්‍යාපෘතිය මඟින් මහල් 4 කින් සමන්විත Roof Top සහිත වෛද්‍ය විද්‍යා පීඨ ව්‍යාධිවේද දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2021 වර්ෂයේදී රු. මිලියන 139 කට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. එම වර්ෂයේදී ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම ගොඩනැගිල්ලේ පළමු මහල් දෙක නිමකිරීම සඳහා රු. මිලියන 134.82 ක් වැයකිරීමට සිදුවී ඇති අතර, ව්‍යාපෘතියෙන් වෙන්කර තිබූ අරමුදල් අවසන් වීම හේතුවෙන් මෙම මහල් දෙක භාවිතයට ගත හැකි ආකාරයට වැඩ නිමකර කොන්ත්‍රාත්තුව අවසන් කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය උපදෙස් ලබා දී තිබුණි. මූලික ප්‍රමාණපත්‍රයේ ඇතුළත්ව තිබූ විද්‍යාගාරයෙහි අත්‍යවශ්‍ය අංගවලින් තොරව 2023 සැප්තැම්බර් මාසයේදී කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් අවසන් කර ඇතත් මෙම ගොඩනැගිල්ල වසර 2කට ආසන්න කාලයක සිට අපේක්ෂිත භාවිතයට යොදා ගැනීමකින් තොරව නිශ්කාර්ය වී තිබීම පිළිබඳවත් කාරක සභාවේ අවධානය යොමු විය.

## 3.3 ලංකා පොකුණ ප්‍රතිසංස්කරණය කිරීම

ලංකා පොකුණ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2021 සැප්තැම්බර් මාසයේදී රු.6,975,666/- කට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව දින 90 කින් නිමකළ යුතුව තිබුණ නමුත්, 2022 අප්‍රේල් දක්වා දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණද, එකී දීර්ඝ කරන ලද කාලය තුළ ද කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම හේතුවෙන් වැඩබලන උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති විශේෂ රැස්වීමකදී

අසම්පූර්ණ වැඩ නිමකර විශ්වවිද්‍යාලයට බාරදීමේ එකඟතාවය අනුව ගිවිසුම් අවලංගු කිරීමට තීරණය කර තිබූ බව කාරක සභාවට අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. මෙම ප්‍රතිසංස්කරණ කටයුත්තට අදාළ සියලු තොරතුරු කාරක සභාවට වාර්තා කිරීම.

## 3.4 ප්‍රසම්පාදනය සම්බන්ධ ගැටළු

විශ්වවිද්‍යාලය විසින් 2024 වර්ෂයේ අවස්ථා 15කදී පුනරාවර්තන ප්‍රතිපාදන මගින් රු. 5,002,851/- ක ක්‍රීඩා උපකරණ හා ඊට සම්බන්ධිත දේ මිලදී ගෙන ඇති අතර ඉන් අවස්ථා 5 කදී රු. 1,628,290/- ක් වටිනා භාණ්ඩ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩාව භාර නිලධාරිනියට අයත් ස්ථානයකින් මිලදී ගෙන ඇති බව කාරක සභාවට නිරීක්ෂණය විය.

තවද, විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලද පහත ප්‍රසම්පාදන සම්බන්ධයෙන් ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

- රු. 217,500/- ක පිහිනුම් උපකරණ (swimming pool boards) මිලදී ගෙන ඇති අතර ආයතන 07කින් මිල ගණන් කැඳවූවද මෙම ආයතනය පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබීම.
- රු. 354,190/- ක පාවහන් (running shoes) ඇතුළු උපකරණ මිලදී ගැනීමේදී, මෙම සපත්තු සඳහා ආයතන 02ක් මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර, අවම මිල මෙම ආයතනය විසින් ඉදිරිපත් කර ඇති බවත්, අනෙකුත් උපකරණ සඳහා මිල ගණන් 05ක් ලැබී ඇති අතර, මෙම ආයතනය 02 වැනි අවම මිල ඉදිරිපත් කර ඇති බවත්, අවම මිල ඉදිරිපත් කර ඇති ආයතනය භාණ්ඩ සැපයීමට දින 09ක කාලයක් ඉල්ලා ඇති බැවින්, එම ආයතනය ප්‍රතික්ෂේප කර දෙවැනි අවම මිල ඉදිරිපත් කළ ආයතනය තෝරාගෙන තිබීම.

- රු. 193,000/- ක කැරම් බෝඩ් සහ උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් 03ක් ලැබී ඇති අතර මෙම ආයතනය දෙවැනි අවම මිල ඉදිරිපත් කර තිබුණද, අවම මිල ඉදිරිපත් කළ ආයතනය විසින් සාම්පල ඉදිරිපත් නොකිරීම නිසා මෙම ආයතනයෙන් මිලදී ගෙන තිබීම.
- රු. 406,600/- කට අයිතම 09ක් මිලදී ගැනීමට අදාළව ආයතන 02ක් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, අවම මිල ඉදිරිපත් කළ ආයතනය සාම්පල ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම ආයතනයෙන් මිලදී ගෙන තිබීම.
- රු. 457,000/- ක් වටිනා ක්‍රීඩා පන්දු මිලදී ගැනීමට අදාළව, ආයතන 03ක් මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර, අනෙකුත් ආයතන දෙක අවම මිල ගණන් ඉදිරිපත් කළ ද මෙම ආයතනය හැර අනෙකුත් ආයතන 02 සාම්පල ඉදිරිපත් කර නොතිබීම.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 19 දිනැති අංක 1/2024 චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාලය සඳහා වෙනම ප්‍රසම්පාදන අංශයක් පිහිටුවීම කළ යුතු වුවද එය සිදු වී නොමැති බවත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත වීමක් සිදු වී නොමැති බවත් නිරීක්ෂණය කළ කාරක සභාව, උක්ත චක්‍රලේඛය 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය යුතු බව අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. ඉහත මිලදී ගැනීම් පිළිබඳව පරීක්ෂා කොට කාරක සභාවට වාර්තා කිරීම.
ii. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 19 දිනැති අංක 1/2024 චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාලය සඳහා වෙනම ප්‍රසම්පාදන අංශයක් පිහිටුවීම.
iii. උක්ත නව ප්‍රසම්පාදන චක්‍රලේඛයට සියලු විශ්වවිද්‍යාල අනුගත වී තිබේ දැයි සොයා බලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.